ශීර්ෂය 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුලි 03 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරිම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරිම සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 1,384.80 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 1,074.55 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු රු. මිලියන 310.25 ක් හෙවත් සියයට 22.40 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 315.30 | 298.87 | 16.43 | 5.21 |
| මූලධන | 1,069.50 | 775.68 | 293.82 | 27.47 |
| **එකතුව** | **1,384.80** | **1,074.55** | **310.25** | **22.40** |

## 2.2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 29301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම් | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 19.00 | 17.76 | 11.00 | 16.88 | 60.00 | 37.76 |

## 2.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0300/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 6.70 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 05 ක 2016 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 6.62 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0105/000 | 0.06 |
| 6000/0000/00/0002/0145/000 | 0.51 |
| 6000/0000/00/0013/0100/000 | 1.91 |
| 6000/0000/00/0016/0091/000 | 3.95 |
| 6000/0000/00/0018/0095/000 | 0.19 |
| **එකතුව** | **6.62** |

## 2.5 විගණන නිරීක්ෂණය

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845 (1) | අසම්පූර්ණව පවත්වාගෙන තිබුණි. |
| (ඇ) වාහන ලේඛනය | මුදල් රෙගුලාසි 1647 | පවත්වා නොතිබුණි. |

**3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය - විෂය අංක 29301**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 747,319 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට වූ හිඟ හිටි ශේෂ ලෙස පැවතුණි. මෙම හිඟ හිටි ශේෂ තුළ දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන් 12 දෙනෙකු ගෙන් අයවිය යුතු එකතුව රු.112,770 ක ශේෂද වැඩ තහනම් කළ, මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.107, 010 ක ශේෂද පැවතුණි.

**3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2016 වර්ෂවලට අදාල එම වාර්තා 2017 ජුනි 27 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

රු.550,000 ක් වටිනා ලොරි රථයක් සහ රු.400,000 ක් වටිනා ජීප් රථයක් අවුරුදු 1-5 ත් අතර කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර වාර්තා ඉදිරිපත් කර තිබූ නිල නිවාසවල භාණ්ඩ ඌණතා හා අතිරික්තයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

**-----------------------------------------------------------**

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සතු එකතුව රු.10,350,000 ක් වටිනා වාහන තුනක් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමකින් තොරව වර්ෂයකට වැඩි කාලයක සිට භාවිතා කරමින් පැවතුණි.

**3.5 කාර්යසාධනය**

**-----------------**

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) කුඩා රබර් වතු සහ වැවිලි අංශයේ රබර් නැවත වගා හා නව වගා සඳහා අපේක්ෂිත ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 7,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණ ද රබර් මිල අඩු වීම නිසා රබර් වගා කිරීම හෙක්ටයාර 1183 කට සීමා වී තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත බිම් ප්‍රමාණයෙන් සියයට 17 ක් පමණක් රබර් අලුතින් වගා කිරීම සහ නැවත වගාව සිදු වී තිබුණි.

(ආ) සාම්ප්‍රදායික සහ සාම්ප්‍රදායික නොවන රබර් වගා ප්‍රදේශවල හෙක්ටයාර 830 ක අතුරු බෝග වගා කිරීම සඳහා ඇස්තමේන්තු කර තිබුණ ද අතුරු බෝග වගා කිරීම හෙක්ටයාර 139 කට සීමා වී තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත බිම් ප්‍රමාණයෙන් සියයට 17 ක් පමණක් අතුරු බෝග වගා කර තිබුණි.

(ඇ) වැවිලි සමාගම් සහ කුඩා රබර් වතු හිමියන් සඳහා ඉඩම් හෙක්ටයාර 4000 ක් සඳහා වැසි ආවරණ නිකුත් කිරීමට සැලසුම් කර තිබුණු අතර ඒ අතුරින් හෙක්ටයාර 3000 කට අවසර පත්‍ර නිකුත් කර ඉන් හෙක්ටයාර 2635 කට වැසි ආවරණ යෙදීම සඳහා සහනාධාර ලබා දී තිබුණි. ඒ අනුව අපේක්ෂිත පරිදි වැසි ආවරණ සහනාධාර ලබා දීමට අපොහොසත් වූ ප්‍රමාණය සියයට 34 ක් විය.

(ඈ) මොණරාගල හා අම්පාර දිස්ත්‍රික්ක තුල රබර් පැල සිටුවීමේ අපේක්ෂාවෙන් රබර් පැල ලක්ෂ 5 ක් සැපයීමට සැලසුම් කළ ද සැපයූ ප්‍රමාණය පැල 88,170 ක් විය. ඒ අනුව සැපයීමට අපේක්ෂිත රබර් පැල ප්‍රමාණයෙන් සියයට 82 ක් සපයා නොතිබුණි.

**3.6 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**-----------------------------------------**

2016 දෙසැම්බර් මාසය සඳහා දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශයේ මාස 06 සිට වසර 01 දක්වා අතර කාල පරාසයක් ඉක්මවූ නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් වටිනාකම රු. 109,687 ක් විය.

**3.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**----------------------------------**

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු ඇතැම් ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ පරිදි 2015 වර්ෂයේ අයවැය යෝජනා අනුව 2014 ඔක්තෝබර් 15 දින සිට 2015 සැප්තැම්බර් 30 දක්වා ක්‍රමවේද 05 ක් යටතේ කුඩා රබර් වතු හිමියන්ගෙන් රබර් මිලදී ගැනීම මත සහතික මිලක් ගෙවීමට යෝජනා වී තිබුණි. ඒ අනුව 2015 වර්ෂයේ එකතුව රු. මිලියන 2049 ක සහතික මිලක් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. මේ සම්බන්ධව සමාලෝචිත වර්ෂයේ සිදු කළ නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) 2014 දෙසැම්බර් 24 සිට 2015 පෙබරවාරි 10 දක්වා වූ දෙවන ක්‍රමවේදය අනුව රබර් වෙළෙන්දන් මුල් සැපයුම්කරුවන්ගෙන් මිලදී ගත් තොග සහතික මිලට විකුණාගත නොහැකි වූ අවස්ථා වල සහතික මිල වෙනස ඔවුන් වෙත ගෙවා තිබීම පරීක්ෂාවේ දී රබර් කිලෝග්‍රෑම් 8100 ක් වෙනුවෙන් හා කිලෝග්‍රෑමයකට රු.10 බැගින් වූ ලාභාංශ සමඟ සහතික මිල වෙනස රු.445,500 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) දෙවන ක්‍රමවේදය යටතේ වෙළඳ නියෝජිතයෙකු වෙත ගෙවා තිබුණු 16,380,661 ක මුදලින් වැරදි තොරතුරු පදනම් කරගෙන ගෙවා තිබුණු රු.2,009,817 ක් නැවත අයකරගත යුතු වුවත් එසේ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සහතික මිල ගෙවීමේ පළමු ක්‍රමවෙදයෙදී (2014 නොවැම්බර් 15 සිට 2014 දෙසැම්බර් 23 දක්වා)සහතික මිල හා රබර් වෙළඳපල මිල අතර වෙනස සෘජුව ගොවියා වෙත ගෙවා තිබුණි. දෙවන ක්‍රමවේදයේදී අවසාන නිෂ්පාදකයා සහතික මිල ගෙවා මිලදී ගත් රබර් ප්‍රමාණය මත නිෂ්පාදකයාට ගෙවීම්කර තිබුණි. සහතික මිල ක්‍රියාත්මක වූ දිනට හා පළමු ක්‍රමවේදයෙන් දෙවන ක්‍රමවේදයට මාරු වීමේ දී බලපත්‍රලාභි සියලු රබර් මිලදී ගන්නා ආයතන වල 2014 නොවැම්බර් 15 දිනට හා 2015 දෙසැම්බර් 20 දිනට පැවති තොග ගණනය හා විධිමත් ලේඛන පවත්වා නොගැනීම නිසා, පරීක්ෂාවට ලක් කළ පෞද්ගලික නියෝජිත ආයතනයක් අදාල කාල සීමාව තුළ මිලදී ගත් හා විකුණූ රබර් ප්‍රමාණ සැසඳීමේ

දී මිලදී ගත් ප්‍රමාණයට වඩා කිලෝග්‍රෑම් 46,329 ක් විකුණා ඇති බැවින් එම රබර් ප්‍රමාණය ගොවියාගෙන් සහතික මිල නොගෙවා අඩු මිලට මිලදී ගත් ඒවා බවත් (පළමු ක්‍රමවේදය යටතේ) ඒ අනුව එකම රබර් ප්‍රමාණයකට දෙවරක් රජයට සහතික මිල ගෙවීමට සිදු වී තිබුණි.

(ඇ) 2015 ජූලි 01 සිට 2015 සැප්තැම්බර් 30 දක්වා වූ පස් වන ක්‍රමවේදය යටතේ සහතික මිල ගෙවීම පරීක්ෂාවේදී වෙළඳ ආයතන තුනක රබර් මිලදී ගැනීම (RC 14 වාර්තා මඟින්) කුඩා රබර් වතු හිමියන්ගෙන්ම සිදු කළේද යන්න 2015.06.30 දිනැති අංක 2015/02 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛය අනුව තහවුරුකර ගැනීමකින් තොරව රබර් කිලෝග්‍රෑම් 77,459 ක් සඳහා රු.7,443,769 ක් ගෙවා තිබුණි.

## 3.8 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11.1 අනුව ලංසු ඇගයීම් වාර්තාව සමග තාක්ෂණික පිරිවිතරයන්ගේ ප්‍රධාන ප්‍රතිපාදනවලට ලංසුකරුගේ අනුකූලතාව පෙන්නුම් කරන වගුවක් පිළියෙල කළ යුතු වුවත් රු.9,834,717 ක් වටිනා කාර්යාල උපකරණ මිල දී ගැනීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) රබර් සංවර්ධන නිලධාරීන් සඳහා රු. 9,834,717 ක් වූ කාර්යාල උපකරණ මිලදී ගැනීමේදී අදාල ආයතන විසින් දින 21 ක් ඇතුළත භාණ්ඩ සැපයීම සිදුකළ යුතු බව ප්‍රසම්පාදන ලියවිලි වල දක්වා තිබුණ ද නියමිත කාළ සීමාව ඉක්මවා දින 60 ක ප්‍රමාදයකින් භාණ්ඩ සැපයීම කර තිබුණි.

## 3.9 අනාර්ථික ගනුදෙනු

පදියතලාව තවාන සඳහා මායිම් වැට ඉදි කිරීමේ රු.1,389,400 ක කොන්ත්‍රාත් මුදලෙන් නිවැරදි මායිමේ කණු සිටුවා නොතිබීම හා මායිම් කණු අලි ඇතුන් කඩා දැමීම නිසා රු.1,121,107 ක වියදමක් නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

**3.10 කළමනාකරණ දුර්වලතා**

**---------------------------**

මොණරාගල, අම්පාර ප්‍රදේශවලට හා රබර් පර්යේෂණ ආයතනය වෙත රබර් පැල 351,595 ක් ප්‍රවාහනය කිරීම සඳහා දෙපාර්තමේන්තු සතු ලොරි රථ යොදා නොගෙන පෞද්ගලික ලොරි රථ යොදා ගැනීම හේතුවෙන් එකතුව රු. 13,213,595 ක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවීමට සිදු වී තිබුණි.

**3.11 මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**--------------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** | **අතිරික්ත සංඛ්‍යා** |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 30 | 25 | 05 | |
| (ii) | තෘතියික මට්ටම | 16 | 03 | 13 | |
| (iii) | ද්විතියික මට්ටම | 364 | 318 | 56 | |
| (iv) | ප්‍රාථමික මට්ටම | 72 | 67 | 05 | |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) * | - | 10 | - | 10 |
| | **එකතුව** | **482** | **423** | **79** | **10** |

* තේ ශක්ති අරමුදලේ සේවය කළ කළමනාකරණ සහකාර නිලධාරින් දසදෙනෙකු 2016 ඔක්තෝම්බර් 01 දින සිට දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කර තිබූ අතර එම නිලධාරීන් විධිමත් ලෙස ආයතනයට බඳවාගෙන නොතිබුණි.